**පොල්පිතිගම ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-------------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 28 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට පොල්පිතිගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**-------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**---------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉඩම් හා ගොඩනැගිලි උපලේඛනය නිවැරදි කිරීම සඳහා යොදා තිබුණු රු.569,473 ක් වූ ජ'නල් සටහනට අදාළ නිශ්චිත වත්කමක් භෞතිකව හඳුනාගෙන නොතිබුණි.

(ආ) සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලි 07 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වැටුප් ප්‍රතිපූර්ණ රු.266,515 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**
**------------------------**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු.27,843,229 ක් වුවද, ශේෂ පිරික්සුමට අනුව එය රු.30,937,065 ක් හා ශේෂ පත්‍රය අනුව රු.31,203,580 ක් ලෙස දැක්විණි.

**1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**
**--------------------------------**

(අ) ලැබියයුතු ගිණුම්
--------------------

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ලැබියයුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.51,235,535 ක් වූ අතර,එයින් රු.2,334,843 ක් වර්ෂ එකකට වැඩි කාලයක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එයින් රු.2,303,360 කට අදාලව කර්මාන්ත ණයගැති ලිපිගොණුවල අඩුපාඩුකම් නිසා අයකර ගැනීමට නොහැකි වී තිබූ අතර, විශ්‍රාමලත් ලේකම්වරිය විසින් 2012 වර්ෂයේදී ලබාගත් රු.30,000 ක නොපියවූ අත්තිකාරම් මුදලක්ද පැවතුණි.

(ආ) ගෙවියයුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.49,878,927ක් වූ අතර, රු.10,458,780 ක් වර්ෂ එකකට වැඩි කාලයක සිට නිරවුල් කිරීමකින් තොරව පැවතුණි.

### 1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.601,864 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

### 1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය | - | සභා බල ප්‍රදේශය තුළ වූ නව සංවර්ධිත ප්‍රදේශවල පිහිටි දේපල හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) අංක 1996 දරණ 2016 දෙසැම්බර් 02 දිනැති ගැසට් පත්‍රය | 103,200 | සභාබල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කර තිබූ ස්ථාවර දැන්වීම් පුවරු සඳහා ගාස්තු අයකර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,636,803 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායමරු.8,126,043 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කල ආදායම් හා හිඟහිටි ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල්කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තුගත ආදායම | 2016 බිල්කළ ආදායම | 2016 රැස්කළ ආදායම | 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| I. | වරිපනම් හා බදු | 316 | 438 | 424 | - | 2,336 | 2,257 | 2,257 | - |
| II. | කුලී | 6,998 | 6,696 | 6,635 | 11 | 6,180 | 6,264 | 6,269 | 19 |
| III. | බලපත්‍ර ගාස්තු | 2,180 | 2,737 | 2,726 | - | 1,650 | 2,477 | 2,477 | - |
| IV. | වෙනත් ආදායම් | 59,919 | 50,813 | 57,141 | 26,478 | 47,345 | 48,863 | 43,367 | 22,140 |
| එකතුව | | 69,413 | 60,684 | 66,926 | 26,489 | 57,511 | 59,861 | 54,370 | 22,159 |

සටහන

2017 වර්ෂයේ රැස්කළ ආදායම තුළ ඉකුත් වර්ෂවලට අදාළව අයවීම රු.6,637,908 ක් විය.

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ රුපියල් මිලියන 60 ක ආදායමක් බිල්කර පැවතියද සමාලෝචිත වර්ෂයේදී හිඟ ආදායම් ලැබීම්ද ඇතුළුව රුපියල් මිලියන 67 ක් පමණක් රැස්කර තිබුණි. ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 22 ක් වූ හිඟ ආදායම් සමාලෝචිත වර්ෂය වනවිට රුපියල් මිලියන 26 ක් වී තිබුණි.

### 2.2.3 වරිපනම් හා බදු

සියළු මූලික පහසුකම්වලින් සමන්විත ව්‍යාපාරික ස්ථාන 404 ක් සහා බල ප්‍රදේශය තුළ වර්ෂ ගණනාවක සිට ක්‍රියාත්මක වී තිබුණද, වරිපනම් අය කිරීමට සභාව කටයුතු කර නොමැති බව 2018 ජනවාරි 12 දින සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු උසාවි දඩ රු.9,829,875 ක් හා මුද්දර ගාස්තු රු.6,094,287 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 06ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා හා සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් 06 ආවරණය වන පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

සභාව විසින් එකතු කරනු ලබන කසළවලින් නොදිරන කසළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටි ඉඩමෙහි පිටුපස වැළලීම සිදු කරමින් තිබූ අතර, එම තත්ත්වය තුළින් අනාගතයේදී පාරිසරික ගැටළු ඇති විය හැකි බව නිරීක්ෂණය විය.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

-------------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව විසින් දැනුවත්ව සහා බල ප්‍රදේශයේ ජනතාවගේ විවිධ වූ අවශ්‍යතා වෙනුවෙන් වැඩසටහන් 08 ක් ක්‍රියාත්මක කර තිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවේ ගිණුම් ප්‍රතිපත්ති අනුව සියළු ආදායම් උපචිත පදනමට ගිණුම්ගත කර තිබුණද, මුද්දර ගාස්තු ආදායම් නිවැරදි පදනමක් තුළ හඳුනා ගැනීමකින් තොරව ගිණුම්ගත කර තිබුණි.

(ආ) පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය මත 1999 ජූලි 13 දින වාර්ෂිකව සියයට 2.5 පොලියක් මත ශ්‍රී ලංකා පළාත් පාලන සේවක මහා සංගමයේ තැන්පත් කර තිබූ රු.50,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

--------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තෘතීයික තනතුරක පුරප්පාඩු 01 ක්ද, ද්විතීයික තනතුරක පුරප්පාඩු 08 ක්ද, ප්‍රාථමික තනතුරක පුරප්පාඩු 02 ක්ද පැවති අතර, අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා අනියම්/ කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 09 දෙනෙකු බඳවාගෙන තිබුණි.

(ආ) සභාවේ සේවයේ නියුතු වැඩ අධිකාරීවරයෙකු 2017 වර්ෂයේ සතියේ සඳුදා හා බදාදා දිනවල පමණක් කාර්යාලයේ පැමිණීම සටහන් කරන තිබුණු අතර,2017 වර්ෂයේ සේවයේ නියුතුව සිටිය යුතු ඉතිරි දින 143 සඳහා අත්සන් ලේඛනයේ/ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සලකුණු කර හෝ නිවාඩු ලබාගෙන හෝ බැහැර ගිය ලෙස ලේඛනයේ සඳහන් කර හෝ නොතිබුණි.

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

----------------------------

සභා බල ප්‍රදේශයේ පිහිටි දුරකථන කුළුණු සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර වාර්ෂික වෙළඳ බලපත්‍ර ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබූ අතර කුළුණු ඉදි කිරීමේදී සංවර්ධන බලපත්‍ර හා අනුකූලතා සහතික ලබාදීම සම්බන්ධයෙන් සභාවේ අවධානය යොමුකර නොතිබූ අතර ඒ තුළින් සභා අරමුදලට උපයාගත හැකි ආදායම් අහිමි වී තිබුණි.

## 3.5 අවිධිමත් ගණුදෙනු

--------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මග නැගුම ව්‍යාපෘතියක් මගින් කුට්ටිගල් අල්ලා සංවර්ධනය කර තිබූ දීගම බැව්ලවත්ත මාර්ගයේ කොටසකට නැවත 2016 වර්ෂයේ සභා අරමුදල් රු.491,020 ක් වැයකර කුට්ටිගල් අල්ලා තිබුණි.

අදාළ මාර්ගයේ සභා අරමුදලින් හා ගම නැගුම මගින් සංවර්ධනය කළ කොටස් හඳුනාගත නොහැකි වූ අතර ප්‍රමාණ පත්‍රවලද එම ප්‍රදේශ හඳුනා ගැනීමට පහසුවන අයුරින් සලකුණු කර නොතිබුණි. එමෙන්ම එකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ වකවානුව, ඒ සඳහා වැයකළ මුදල, අදාළ ව්‍යාපෘතිය අකාර්යක්ෂම වීමට හේතු ආදිය සම්බන්ධ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) ඉකුත් වර්ෂයක ප්‍රතිපාදන මත ඉදිකර තිබුණු ගල්කැටියාගම මාර්ගයේකුට්ටිගල් ගැලවී ඇති ස්ථාන නැවත සැකසීම සඳහා රු.424,819 ක් ගෙවා තිබුණු අතර,එවැනි මාර්ග සංවර්ධනයකට අදාළ විස්තර ඇතුළත් කරමින් ලිපිගොණුවක් පිළියෙල කර නොතිබුණි.

## 3.6 වත්කම් කළමනාකරණය

--------------------------

### 3.6.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

-------------------------------------------

සභාව ආරම්භයේ සිට 2018 ජනවාරි 12 දින දක්වාම සුසාන භූමි ඉඩම් වටා වැටවල් ගසා ආරක්ෂා කර නොතිබීමෙන් අනවසර පදිංචිකරුවන් විසින් අත්පත් කර ගැනීම හෝ සුසාන භූමි වශයෙන් පවතින භූමි ප්‍රමාණය ක්‍රමයෙන් අඩුවීමේ අවදානමකට ලක්විය හැකි බව නිරීක්ෂණය විය.

### 3.6.2 පවරා නොගත් වත්කම්

-------------------------

සභා බල ප්‍රදේශයේ සුසාන භූමි 129 ක් ප්‍රාදේශීය ලේකම් සතුව පැවති අතර සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.6.3 නිශ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

------------------------------------

සභාවට පවරා ගැනීමට කටයුතු නොකිරීම හා අපහරණය සඳහා තක්සේරු වාර්තා ලබා ගැනීමේ ප්‍රමාදය මත වාහන 09 ක් නිශ්කාර්යව පැවතුණි.

### 3.6.4 වාහන උපයෝජනය

----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව තුළ මාර්ග ඉදි කිරීම් හා නඩත්තුව සඳහා යොදා ගැනීමට ඩම්ප් ට්‍රක් රථය, මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය, බැකෝ ලෝඩර් යන්ත්‍රය හා මාර්ග තලනයක් තිබුණද යන්ත්‍රෝපකරණ අධිකාරිය ඇතුළු බාහිර ආයතනවල වාහන කුලියට ලබාගෙන අවස්ථා 05 කදී රු.610,606 ක් ගෙවීම් කර තිබුණි.

(ආ) රියදුරන් පාවිච්චි කර අවසන් කළ ධාවන සටහන්වල දෙවන පිටපත විෂය භාර ලිපිකරු වෙතට හෝ අදාළ අංශ වෙතට භාර නොගෙන නැවත අළුත් පොත් නිකුත් කර තිබුණි. තවද වාහන 04 කට අදාළ ධාවන සටහන් පරීක්ෂා කිරීමකින් තොරව ඉන්ධන නිකුත් කර තිබුණි.

## 3.7 ප්‍රසම්පාදන

---------------

### 3.7.1 ප්‍රසම්පාදන සැලැස්ම

-----------------------

සභාව විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තියප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

### 3.7.2 සැපයීම් හා සේවා

-------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන සහ 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 207 ට පටහැනිව කටයුතු කරමින් රු.484,667 ක් වූ මිලදී ගැනීම් 08 ක් එකම ආයතනයකින් සිදුකර තිබුණි. තවත් අවස්ථා 12 කදී ආයතන 02 කින් රු.388,949 ක මිලදී ගැනීම් සිදුකර තිබුණි.

(ආ) වෙළඳපල මිල සැදැහුම් ක්‍රමය යටතේ මිලදී ගැනීම් සිදු කිරීමේදී අවම වශයෙන් මිල ගණන් 03 ක් වත් තිබිය යුතු වුවද, ලැබී තිබූ එක්සැපයුම්කරුවකුගේ මිල පමණක් පදනම් කරගෙන අවස්ථා 04 කදී රු.3,189,554 ක් වූ මිලදී ගැනීම් සිදුකර තිබුණි.

(ඇ) කොන්ත්‍රාත් සැපයුම්කරුවෙකුගේ මිල ගණන් මතමාස 06 ක් තුළ පමණක් නැවත මිලදී ගැනීම් සිදුකළ හැකි වුවද, සභාව විසින් වර්ෂය ආරම්භයේ එක් වරක් මිල ගණන් කැඳවීමෙන් වූ ප්‍රසම්පාදන කමිටු තීරණය මත වර්ෂය පුරාම අවස්ථා 14 කදී රු.8,162,557 ක් වූ මිලදී ගැනීම් සිදුකර තිබුණි.

(ඉ) සභාවේ ප්‍රසම්පාදන කමිටුවක් පැවතියද ඉදිකිරීම් කටයුතු සඳහා පමණක් ප්‍රසම්පාදන කමිටු තීරණ ක්‍රියාත්මක කර තිබූ අතර, අනෙකුත් භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ නොමැතිව කළමනාකරණ කමිටු තීරණ මතසමාලෝචිත වර්ෂයේ අවස්ථා 60 කදී රු.12,886,984 ක් වූ මිලදී ගැනීම් සිදුකර තිබුණි.

### 3.7.3 කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) දොරවේරුව වත්ත අශෝකාරාමය ට්‍රැක් 07 මාර්ගය සඳහා අන්තර් සම්බන්ධිත කුට්ටි ගල් ඇල්ලීමේ කර්මාන්තයේ වැඩ විෂයය අංක 05 යටතේ හැඩයම් ගැසීම හා වැඩ විෂයය අංක 06 යටතේ මාර්ගය දෙපස වැටි (කර්බ්) සඳහා කොන්ක්‍රීට් ඇතිරීමේදී නියමිත පිරිවිතරයන්ට නොතිබීම නිසා පිළිවෙලින් රු.20,850 ක් හා රු.19,760 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) දඹගහමුල හන්දියේ සිට අගාර බන්ට් පාර දක්වා වෙල මැද මාර්ගය බොරළු අතුරා ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් රු.199,342 ක් ගෙවා තිබුණද, දඹගහමුල අන්තයේ සිට මාර්ගය සෝදා පාළුවට ලක්ව තිබුණු අතර මාර්ගය පුරා විවිධ ප්‍රමාණයේ වලවල් මතුව පැවතුණි.

(ඇ) පොතුවැපිටිය මාර්ගයට කුට්ටිගල් අල්ලා සංවර්ධනය කිරීම් කර්මාන්තයේ වැඩ විෂයය අංක 05 යටතේ කර්බ් හැඩයම් ගැසීම නියමිත පිරිවිතරයන්ට නොතිබීම නිසා රු.18,324 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(ඇ) රබේ මැද කොළණිය මාර්ගය තම්බුව හෙනව මාර්ගය දක්වා බොරළු අතුරා ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් රු.197,552 ක් ගෙවීම් කර තිබුණද, මාර්ගය මැදින් ජලය ගලාගෙන යාම හේතුවෙන් මාර්ගයේ බොරළු ඇතිරීම සෝදා පාළුවට ලක්වී තිබුණු අතර විවිධ ප්‍රමාණයේ වලවල් පාර පුරාවට දක්නට ලැබුණි.

(ඉ) කුඹුක්කඩවල පොතානේගම සමිති ශාලාව අසල සිට නිපුනගම දක්වා මාර්ගය කුට්ටිගල් අල්ලා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ වැඩ විෂයයන්02 යටතේ එකතුව රු.52,950 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

සභාව විසින් අභ්‍යන්තර විගණනය සඳහා නිලධාරියෙක් පත්කර තිබුණද, එම නිලධාරියාට වෙනත් රාජකාරිද පවරා තිබුණි. සමාලෝචිත වර්ෂයට අදාළව ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණු අතර අභ්‍යන්තර විගණන වාර්තා 04 ක් පමණක් නිකුත් කර තිබුණි.

**5. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| (අ) වත්කම්/දේපල | (i) ආරක්ෂාව තහවුරු නොකිරීම. |
| | (ii) වත්කම් ඵලදායී ලෙස උපයෝජනය නොකිරීම. |
| (ආ) මිලදී ගැනීම් | ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය නොකිරීම. |
| (ඇ) ව්‍යාපෘති/කොන්ත්‍රාත් | (i) ප්‍රමාණවත් අධීක්ෂණයක් නොමැතිවීම. |
| | (ii) නියමිත ප්‍රමිතියට ඉටු නොකිරීම. |